# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2080/34 - 2018 ජූලි මස 17 වැනි අඟහරුවාදා - 2018.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 7/2001 (III)

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**තිලක් මාරපන,**
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

**I වන කොටස**

***මූලික විධිවිධාන***

1. මේ නියෝග 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානයට අදාළව සම්බාධක පැනවීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉරානයට අදාළ 1737 (2006) සහ 2231 (2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනා සම්මුති සහ ඉරානයට අදාළව පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුති සහ, ඉරානයට අදාළව කලින් ගෙන එන ලද යම් යෝජනා සම්මුති පරිච්ඡින්න කරන, ප්‍රතියෝජනය කරන හෝ සංශෝධනය කරන සියලු යෝජනා සම්මුති බලාත්මක කරමින්, සමූලඝාතක අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට හැකියාව ලබා දීම මේ නියෝගවල අරමුණ වන්නේ ය.

3. මේ නියෝග -

(අ) ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට සහ කුමන ස්ථානයක පිහිටිය ද ශ්‍රී ලංකාවේ නීතියක් යටතේ සංස්ථාගත කරන ලද සංස්ථාපිත මණ්ඩලවලට ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ ධජය දරා ගමන් කරනු ලබන යාත්‍රාවකට ;

(ඇ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයකට ; සහ

(ඈ) කුමන ස්ථානයක පිහිටිය ද ශ්‍රී ලංකා ධජය සහිතව ගමන් කරන යාත්‍රාවක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ගුවන් යානයක සිදු කරනු ලබන වරදකට,

අදාළ විය යුතු ය.

1A - PG 4125 — 507 (2018/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මේ නියෝගවල කාර්ය සඳහා, ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිසි බලධරයකු සිටිය යුතු ය.

5. නිසි බලධරයා සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් :-

(අ) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ 2231 (2015) දරන යෝජනා සම්මුතිය හෝ ඊට අදාළව පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුතියක් ප්‍රකාරව පිහිටුවන ලද එහි යම් කමිටු විසින් නම් කරන ලද ස්වාභාවික සහ නෛතික තැනැත්තන් සහ ආස්ථිත්‍ය (මෙහි මින්මතු ''නම්කළ තැනැත්තා හෝ ආස්ථිත්‍ය'' යනුවෙන් හඳුන්වනු ලබන) පිළිබඳව වූ නම් කිරීම් සහ අවලංගු කිරීම් ආයතන වෙත දැනුම් දීම ; සහ

(ආ) මේ නියෝග යටතේ ආයතනවලට ඇති බැඳීම් සහ කාර්ය පිළිබඳව ඔවුන්ට මාර්ගෝපදේශ සහ විධාන ලබා දීම,

සම්බන්ධයෙන් වගකිව යුතු ය.

6. ආයතනවල අධීක්ෂණ අධිකාරීන්වල කර්තව්‍ය විය යුත්තේ :-

(අ) ඔවුන් විසින් අධීක්ෂණය කරනු ලබන සියලු තැනැත්තන් සහ ආස්ථිත්‍යයන් හරහා සීඝ්‍ර ලෙස මුදල් සැපයීමේ අවදානම් මට්ටම අධීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම ; සහ

(ආ) ඔවුන් විසින් අධීක්ෂණය කරනු ලබන ස්වභාවික තැනැත්තන් සහ ආස්ථිත්‍යයන් මේ නියෝගවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සහ මේ කාර්ය සඳහා අවදානම් මත පදනම් වූ අධීක්ෂණ වැඩසටහනක් ඇති කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මේ නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් තැනැත්තන් සහ ආස්ථිත්‍යයන්ට මාර්ගෝපදේශ ලබා දීම ;

(ඈ) මේ නියෝගවල IV වන කොටස යටතේ වාර්තා ලබා ගැනීම ; සහ

(ඉ) මේ නියෝගවලට අනුකූල වීම බලාත්මක කිරීම.

වේ.

7. මූල්‍ය බුද්ධි ඒකකය සහ ආයතනවල අධීක්ෂණ අධිකාරීන් විසින් මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම අධීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම සිදුකළ යුතු අතර මේ නියෝග උල්ලංඝනය කිරීම විමර්ශනය කළ යුතු ය.

## II වන කොටස

### *තැනැත්තන් සහ ආස්ථිත්‍යයන් නම් කිරීම*

8. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ 1737 (2006) සහ 2231 (2015) දරන යෝජනා සම්මුති සහ, ඉරානයට අදාළ යම් පසු යෝජනා සම්මුති සහ ඉරානයට අදාළව කලින් ගෙන එන ලද යම් යෝජනා සම්මුති පරිච්ඡින්න කරන, ප්‍රතියෝජනය කරන හෝ සංශෝධනය කරන සියලු යෝජනා සම්මුති ප්‍රකාරව පිහිටුවන ලද යම් කමිටුවක් විසින් සිදු කරනු ලබන තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් නම් කිරීමකට -

(අ) ශ්‍රී ලංකාව තුළ වහාම අදාළ කරගැනීමක් තිබිය යුතු ය ; සහ

(ආ) මේ නියෝගවල නිශ්චිතව සඳහන් කර ඇති තහනම් කිරීම් පැනවීම වහාම බලාත්මක කිරීමක් තිබිය යුතු ය.

## III වන කොටස

### *තහනම් කිරීම*

9. (1) යම් අරමුදල් හෝ වෙනත් වත්කම්,

(අ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් ;

(ආ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ; හෝ

(ඇ) නම් කළ තැනැත්තකුගේ හෝ ආස්ථිත්‍යයක විධානය පරිදි,

ඍජුව හෝ වක්‍රව, සම්පූර්ණයෙන් හෝ හවුල් වශයෙන්, අයිතිය ඇති හෝ දරනු ලබන අරමුදල් හෝ වෙනත් වත්කම් වන්නේ ද යන්න පිළිබඳව දැනුවත්ව හෝ ඒ පිළිබඳව නොසැලකිලිමත්ව යම් තැනැත්තකු විසින් එකී අරමුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් ගනුදෙනු කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් අරමුදල්, වෙනත් වත්කම් හෝ මූල්‍ය සේවා, ඍජුව හෝ වක්‍රව, සම්පූර්ණයෙන් හෝ හවුල් වශයෙන් ලබා දෙනු ලබන්නේ -

(අ) නම් කළ තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට ද ;

(ආ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට ද ;

(ඇ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට ද ;

(ඈ) නම් කළ තැනැත්තකුගේ හෝ ආස්ථිත්‍යයක ප්‍රතිලාභය සඳහා ද ;

යන්න පිළිබඳව දැනුවත් ව හෝ ඒ පිළිබඳව නොසැලකිලිමත් ව එම අරමුදල්, වෙනත් වත්කම් හෝ මූල්‍ය සේවා ලබා දීම නොකළ යුතු ය.

10. යම් ක්‍රියාවිරහිත කරන ලද ගිණුමකට බැර කරනු ලබන අරමුදල් ද ක්‍රියාවිරහිත කරන ලද අරමුදල් වන තාක් දුරට, 9 වන නියෝගය යටතේ ක්‍රියා විරහිත කරන ලද ගිණුමක් බවට එම ගිණුම පත්වීමට පෙරාතුව අවසන් කරන ලද හෝ උපචිත වූ එම ගිණුම මත අයවිය යුතු පොලිය හෝ, වෙනත් ඉපැයීම් හෝ, ගිවිසුම්, එකඟතා හෝ බැඳීම් යටතේ අයවිය යුතු ගෙවීම් හෝ, තෙවන පාර්ශ්වයක් විසින් එම ගිණුම වෙත පවරන ලද වෙනත් අරමුදල්, යම් තැනැත්තකු විසින් ක්‍රියා විරහිත කරන ලද ගිණුමට බැර කරනු ලැබිය හැකි ය.

11. 9 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග වලට යටත්වන අරමුදල් හෝ වෙනත් වත්කම් දරනු ලබන තැනැත්තකු විසින්, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ගයට පෙරාතුව කවර හෝ විටක දී, ස්වකීය අරමුදල් හෝ වෙනත් වත්කම් ක්‍රියා විරහිත කිරීමට නියමිත බවට හෝ ඒ වත්කම් ලබා නොදෙන බවට ඒ නම් කළ තැනැත්තා වෙත දැනුම් දීම තහනම් වේ.

12. 9 වන සහ 11 වන නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය.

13. (1) යම් තැනැත්තකුට හො ආස්ථිත්‍යයකට අයත් වත්කම්, එකී තැනැත්තාට හෝ ආස්ථිත්‍යයට යම් නම් කළ තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට අයත් සර්වසම අනන්‍යතාවක් තිබීම යන කරුණු හේතුවෙන් ක්‍රියා විරහිත කර ඇති අවස්ථාවක දී, යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් නිසි බලධරයා වෙත එම වත්කම් ක්‍රියා විරහිත කරනු ලැබ ඇති තැනැත්තා හෝ ආස්ථිත්‍යය, නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් ද යන වග සත්‍යාපනය කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එම ඉල්ලීම ලැබීමෙන් පසුව, නිසි බලධරයා විසින්, වත්කම් ක්‍රියා විරහිත කරනු ලැබ ඇති ස්වභාවික හෝ නෛතික තැනැත්තාගේ හෝ ආස්ථිත්‍යයේ අනන්‍යතාවය, නම් කිරීමේ ක්‍රියාවක දී හඳුනාගත් යම් තැනැත්තකුගේ හෝ ආස්ථිත්‍යයක අනන්‍යතාවයට අනුරූපී වන්නේ ද යන්න පරීක්ෂා කරමින්, හැකිතාක් කෙටියෙන්, උනන්දුවක් දක්වන පාර්ශ්වයේ ඉල්ලීම සඳහා හේතු වූ කරුණු සත්‍යාපනය කරනු ලැබිය යුතු ය.

(3) බලපෑමට ලක් වූ තැනැත්තාගේ හෝ ආස්ථිත්‍යයේ අනන්‍යතාවය නම් කළ තැනැත්තකුගේ හෝ ආස්ථිත්‍යයක අනන්‍යතාවයට සම වීම අසත්‍යයක් බවට නිශ්චය කොට දැන ගනු ලැබූ විට, නිසි බලධරයා විසින්, 9 වන නියෝගයට අනුකූලව වත්කම් ක්‍රියා විරහිත කරන ලද තැනැත්තා වෙත එම කරුණ දැනුම් දෙනු ලැබිය යුතු අතර එවැනි දැනුම් දීමකින් පසුව, එම තැනැත්තා විසින් 9 වන නියෝගය යටතේ ගෙන ඇති ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග වහාම ඉවත් කරගත යුතු ය.

## IV වන කොටස

### *වාර්තා කිරීම සඳහා වූ වගකීම්*

14. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් නම් කළ තැනැත්තෙක් හෝ ආස්ථිත්‍යයක් සම්බන්ධයෙන්, යම් ආයතනයක් විසින් -

(අ) තම වර්තමාන ගනුදෙනුකරුවකු හෝ, තමා ව්‍යාපාර කටයුතු සිදු කර ඇති ගනුදෙනුකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් හෝ, තමා විසින් දැන සිටින වෙනත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් හෝ යම් නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් බවට හෝ, නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකු බවට, තමා විසින් දැන සිටිනම් හෝ සැක කරනු ලබන්නේ නම්, ඒ පිළිබඳව නිසි බලධරයා, මූල්‍ය බුද්ධි ඒකකය සහ ආයතනවල අධීක්ෂණ අධිකාරීන් වෙත දැනුම් දිය යුතු ය ;

(ආ) පහත සඳහන් කාරණා සම්බන්ධයෙන්, එනම් -

(i) 9 වන නියෝගය යටතේ ක්‍රියා විරහිත කරන ලද අරමුදල්වල සහ අරමුදල් සම්බන්ධයෙන් ගන්නා ලද වෙනත් යම් ක්‍රියාමාර්ගවල තත්ත්වය පිළිබඳව ;

(ii) නම් කළ තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙනුවෙන් අදාළ ආයතනය විසින් දරන ලද යම් අරමුදල් හෝ වෙනත් වත්කම්වල ස්වභාවය සහ ගණන හෝ ප්‍රමාණය හෝ, යම් තැනැත්තකු විසින් නම් කළ තැනැත්තා හෝ ආස්ථිත්‍ය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද හෝ දරන ලද ගනුදෙනු පිළිබඳව ;

(iii) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් හෝ වෙනුවෙන් සිදු කරන ලද යම් ගනුදෙනුවක් හෝ සිදු කිරීමට තැත් කරන ලද යම් ගනුදෙනුවක් පිළිබඳව ;

(iv) ක්‍රියා විරහිත කරන ලද අරමුදල් හෝ වෙනත් වත්කම් සම්බන්ධයෙන් සිදු කරන ලද යම් ගනුදෙනුවක් හෝ සිදු කිරීමට තැත් කරන ලද යම් ගනුදෙනුවක් පිළිබඳව ; සහ

(v) මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමට පහසුකම් සලස්වනු ලබන වෙනත් යම් තොරතුරු පිළිබඳව ;

නිසි බලධරයා වෙත සහ මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(ඇ) මේ තොරතුරු සත්‍යාපනය කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගීව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගවලට අනුකූලව සපයන ලද හෝ ලැබුණු යම් තොරතුරක් එම තොරතුරු සපයනු ලැබූ හෝ ලැබී ඇති කාර්ය සඳහා පමණක් භාවිත කරනු ලැබිය යුතු ය. මේ නියෝගවලට අනුකූලව නිසි බලධරයා වෙත හෝ මූල්‍ය බුද්ධි ඒකකය වෙත සපයන ලද යම් තොරතුරක්, යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් පනවා ඇති යම් සීමා කිරීමක් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (අ) යම් තැනැත්තකු හෝ තැනැත්තියක් විසින් දරනු ලබන යම් වත්කමක් යම් නම් කළ තැනැත්තකුට හෝ ආස්ථිත්‍යයකට අයත් බව හෝ එය එවැන්නකු විසින් පාලනය කරනු ලබන බව හෝ එවැන්නකු වෙනුවෙන් හෝ එවැන්නකුගේ විධානය මත දරනු ලබන බව හෝ එසේ විය හැකි බවට සැක කරන එකී තැනැත්තා හෝ තැනැත්තිය විසින්, එම සැකය සත්‍යාපනය කර ගැනීම පිණිස මූල්‍ය බුද්ධි ඒකකය වෙත පිටපතක් ද සමග නිසි බලධරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) එම ඉල්ලීම සමග එම ඉල්ලීම කරනු ලබන තැනැත්තා දන්නා පරිදි වත්කමෙහි විස්තර සහ එම වත්කමෙහි හිමිකරු හෝ පාලකයා පිළිබඳ විස්තර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) (අ) වන ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තෙකුට සහාය වීමට නිසි බලධරයා විසින් උපරිම උත්සාහය යෙදවිය යුතු ය.

(ඈ) (අ) වන ඡේදය යටතේ යම් ඉල්ලීමක් ලැබීමෙන් පසු, ප්‍රායෝගිකව හැකි ඉක්මනින්, නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් -

(i) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එම දේපළෙහි අයිතිය දැරීම හෝ පාලනය කිරීම සිදු විය හැකි බවට ;

(ii) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එම දේපළෙහි අයිතිය දැරීම හෝ පාලනය කිරීම සිදු විය නොහැකි බවට ; හෝ

(iii) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යක් විසින් එම දේපළෙහි අයිතිය දැරීම හෝ පාලනය කිරීම සිදු වන්නේ ද යන්න නොදන්නා බවට,

සඳහන් කරමින් ලිඛිතව ප්‍රතිචාර දැක්විය යුතු ය.

## V වන කොටස

### බලය ලබාදීම්

15. (1) (අ) යම් මූලික වියදමක් ;

(ආ) මේ නියෝග යටතේ අරමුදල් හෝ වෙනත් වත්කම්, ක්‍රියා විරහිත කරන ලද බවට පත් වූ දිනයට පෙරාතුව උපචිත වූ ගිවිසුම්ගත බැඳීමක් ;

(ඇ) අති විශේෂ වියදමක් ; හෝ

(ඈ) තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් නම් කිරීමට පෙරාතුව එළඹ ඇති අධිකරණමය, පරිපාලනමය හෝ බේරුම්කරණ ලියමක් හෝ තීන්දුවක් ඇති විටෙක එකී ලියම හෝ තීන්දු ප්‍රකාශය ඉටු කිරීම සඳහා අවශ්‍ය වත්කමක්,

සපුරාලීම සඳහා ක්‍රියා විරහිත කරන ලද අරමුදල් හෝ වෙනත් වත්කම් භාවිත කිරීමට අවසර ලබාදීම අවශ්‍ය යයි නිසි බලධරයා විසින් සලකනු ලබන විට ඔහු විසින් විශේෂ බලය ලබා දීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ කාර්ය සඳහා -

''මූලික වියදම'' යන්නෙන්, පහත දැක්වෙන කවර හෝ කාර්යයක් සඳහා අත්‍යවශ්‍යයෙන්ම දරනු ලබන යම් වියදමක් අදහස් වේ.

(අ) ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම ;

(ආ) කුලී හෝ උකස්කර ගෙවීම ;

(ඇ) ඖෂධ හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම ;

(ඈ) බදු ගෙවීම ;

(ඉ) රක්ෂණ වාරික ගෙවීම ;

(ඊ) උපයෝගීතා ගාස්තු ගෙවීම ;

(උ) සාධාරණ වෘත්තීය ගාස්තු ගෙවීම ;

(ඌ) නෛතික සේවා සැපයීම සම්බන්ධයෙන් වන සාධාරණ වියදම් ගෙවීම ;

(එ) ක්‍රියා විරහිත කරන ලද වත්කම් සාමාන්‍ය පරිදි දැරීම හෝ පවත්වාගෙන යාම සඳහා යම් ලිඛිත නීතියකට අනුකූලව ගෙවිය යුතු ගාස්තු හෝ සේවා ගාස්තු ගෙවීම ;

(ඒ) වෙනත් යම් සමාන කාර්යයක් ;

''අති විශේෂ වියදම'' යන්නෙන්, නිසි බලධරයා විසින්,

(අ) අවශ්‍ය යැයි ; සහ

(ආ) 2231(2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සහා යෝජනා සම්මුතියේ හෝ ඒ සම්බන්ධයෙන් වන පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුතියක නියමයන් උල්ංඝනය කරනු නොලබන බවට,

සලකනු ලබන මූලික වියදමක් හෝ ගිවිසුම්ගත බැඳීමක් නොවන යම් ගෙවීමක් අදහස් වේ.

16. (1) යම් තහනම් කිරීමක් උල්ලංඝනය කරනු ලබන ක්‍රියාව ඃ

(අ) ඒකාබද්ධ පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්මේ III වන ඇමුණුමෙහි විස්තර කරනු ලබන සිවිල් න්‍යෂ්ටික සහයෝගීතා ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය වන්නේ නම් ; හෝ

(ආ) ඒකාබද්ධ පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන යම් ක්‍රියාවක් සඳහා අවශ්‍ය වන්නේ නම්,

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව විසින් හෝ, 2231(2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනා සම්මුතිය හෝ ඒ සම්බන්ධයෙන් පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුතියක් ප්‍රකාරව පිහිටුවන ලද යම් කමිටුවක් විසින් නම් කරන ලද තැනැත්තන් හා ආස්ථිත්‍යයන් සම්බන්ධයෙන්, නිසි බලධරයා විසින් බලය ලබා දීමක් ප්‍රදානය කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) බලය ලබා දීමක් ප්‍රදානය කිරීමට පෙරාතුව, නිසි බලධරයා විසින් -

(අ) එවැනි බලය ලබා දීමක් මගින් 2231(2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනා සම්මුතිය හෝ ඒ සම්බන්ධව පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුතියක විධිවිධානයක් උල්ලංඝනය වන්නේ ද යන්න සැලකිල්ලට ගත යුතු ය.

(ආ) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාව හෝ, 2231(2015) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනා සම්මුතිය හෝ ඒ සම්බන්ධව පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුතියක් ප්‍රකාරව පිහිටුවන ලද එහි කමිටු විසින් නියම කරනු ලබන යම් අනුමත කිරීම් ඉල්ලා සිටීම සහ, නියමිත යම් දැන්වීම් ඔවුන් වෙත ලබා දීම සිදු කළ යුතු ය ; සහ

(ඇ) බලය ලබාදීමට අදාළව විදේශීය ආණ්ඩුවකින් කරනු ලබන යම් සන්නිවේදනයක් පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතු ය.

(ඉ) නිසි බලධරයා විසින් මේ නියෝගවල විධිවිධාන යටතේ කරනු ලබන යම් බලය ලබාදීමක් සම්බන්ධයෙන් යම් කොන්දේසි පනවනු ලැබිය හැකිය.

17. යම් තැනැත්තෙකු විසින් මේ නියෝගවල විධිවිධාන යටතේ යම් බලය ලබා දීමක් සඳහා සිදු කරන ලද යම් ඉල්ලීමක් පිළිබඳව නිසි බලධරයා විසින් සාධාරණ කාලයක් තුළ දී නිශ්චය කරනු ලැබිය යුතු අතර ;

(අ) බලය ලබා දීමට සම්බන්ධිත යම් කොන්දේසි ඇත්නම් ඒවා ද ඇතුළු කර එම බලය ලබා දීම ප්‍රදානය කිරීම ; හෝ

(ආ) බලය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම ;

සඳහා ලිඛිතව ඉල්ලුම්කරු වෙත ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### විවිධ කරුණු

18. මේ නියෝග යටතේ වූ යම් බැඳීමක් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය විය හැකි බවට අදාළ වන යම් කාරණයක් හෝ තොරතුරක් නිසි බලධරයා, මූල්‍ය බුද්ධි ඒකකය සහ අමාත්‍යවරයා විසින්, උචිත නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ආයතන සම්බන්ධයෙන් වන විට දී, පරිපාලනමය දණ්ඩන පැනවිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා ආයතනවලට අදාළ අධීක්ෂණ අධිකාරීන් වෙත යොමු කළ යුතු ය.

19. නිසි බලධරයා විසින් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, මූල්‍ය බුද්ධි ඒකකය, ආයතනවල අධීක්ෂණ අධිකාරීන් සහ වෙනත් උචිත නියෝජ්‍යායතන විමසා, මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම අධීක්ෂණය කිරීම සහ මේ නියෝගවලට අදාළ දණ්ඩන බලාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු ය.

20. නිසි බලධරයා සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින්, මේ නියෝග යටතේ වූ පරිචයන් ක්‍රියාත්මක කිරීම සහ බැඳීම් බලාත්මක කිරීම සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

21. නිසි බලධරයා විසින්, මේ නියෝගවල විධිවිධාන බලාත්මක කිරීමේ දී, යම් තැනැත්තකු හෝ රාජ්‍ය ආයතනයක් විමසීම සහ යම් තැනැත්තකුගෙන් හෝ රාජ්‍ය ආයතනයකින් තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

22. කිසිදු තැනැත්තකු විසින් මේ නියෝගවලට අනුකූලව, සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු නොකර හරින ලද යම් ක්‍රියාවක් සඳහා යම් සිවිල් හෝ සාපරාධී වගකීමකට යටත් නොවිය යුතු ය.

## VII වන කොටස

### අර්ථ නිරූපණ

23. මේ නියෝගවල කාර්ය සඳහා -

''පාලනය'' යන්නෙන්, මූල්‍ය හෝ මෙහෙයුම් ප්‍රතිපත්ති පිළිබඳ වූ තීරණ කෙරෙහි බලපෑමක් අධිකාරියක් හෝ බලය ක්‍රියාත්මක කිරීම අදහස් වන අතර එයට නෛතික හෝ සාධාරණ බලයක් ඇති හෝ නොමැතිව සහ නෛතික හෝ සාධාරණ අයිතීන් මත පදනම් ව හෝ එසේ නොමැතිව, හාර එකඟතා, වැඩ පිළිවෙළ, අවබෝධතා හෝ පරිචයන්වල ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඒවා මගින් වන පාලනය ඊට ඇතුළත් වේ. ''පාලනය කරන ලද'' යන්නට අනුරූපී අර්ථයක් තිබේ ;

''ගනුදෙනු'' යන්නට විකිණීම, සැපයීම, බදු දීම, පැවරීම, පරිවර්තනය කිරීම, බැහැර කිරීම, චලනය හෝ භාවිතය ඇතුළත් වන අතර ''ගනුදෙනු කිරීම'' සහ ''ගනුදෙනු කරන ලද යන්නට එම අර්ථය ම තිබේ ;

''ආස්ථිත්‍යය'' යන්නට යම් සංස්ථාපිත නොවන මණ්ඩලයක්, කණ්ඩායමක් සංගමයක්, සංවිධානයක්, ආයතනයක් හෝ වැඩ පිළිවෙළක් ඇතුළත් වේ ;

''මූල්‍ය බුද්ධි ඒකකය'' යන්නෙන් 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධිඒකකය අදහස් වේ ;

''මූල්‍ය සේවා'' යන්නෙන් 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථානුකූලව ''මූල්‍ය ව්‍යාපාරයක්'' සංස්ථාපනය කරනු ලබන යම් ක්‍රියාකාරකමක නිරත වීම අදහස් වේ ;

''අරමුදල් හෝ වෙනත් වත්කම්'' යන්නෙන් මූල්‍ය වත්කම්, (තෙල් සහ වෙනත් ස්වභාවික සම්පත් ඇතුළු) ආර්ථික සම්පත්, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ කළ නොහැකි, චංචල හෝ නිශ්චල කවර හෝ ආකාරයකින් අත්කර ගනු ලැබූ ඕනෑම ආකාරයක දේපළ සහ විද්‍යුත් හෝ ඩිජිටල් ඇතුළු ඕනෑම ආකාරයකින් වූ, බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර හෝ ණයවර ලිපි ඇතුළු එවැනි අරමුදල් හෝ වෙනත් වත්කම් පිළිබඳ අයිතිය සඳහා සාක්ෂි දරනු ලබන හෝ ඒ කෙරෙහි වන සම්බන්ධතාවය සඳහා සාක්ෂි දරනු ලබන නෛතික ලේඛන හෝ සාධන පත්‍ර සහ එවැනි අරමුදල් හෝ වෙනත් වත්කම් මගින් උපචිත වන හෝ උත්පාදනය වන යම් පොළී, ලාභාංශ හෝ වෙනත් ආදායම් හෝ වටිනාකම් සහ අරමුදල්, භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම සඳහා භාවිත කරනු ලැබීමේ හැකියාවක් පවතින වෙනත් යම් වත්කම් ඇතුළත්ව එහෙත් ඒවාට සීමා නොවන්නා වූ යම් වත්කම් අදහස් වේ ;

''ක්‍රියා විරහිත කරන ලද වත්කම්'' යන්නෙන් මේ නියෝග මගින් පනවන ලද තහනම හේතුවෙන් ගනුදෙනු කරනු ලැබිය නොහැකි වූ යම් වත්කමක් අදහස් වේ ;

''ආයතනය'' යන්නට 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඒ සඳහා ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

''ඒකාබද්ධ පරිපූර්ණ ක්‍රියාකාරී සැලැස්ම'' (JCPOA) යන්නෙන් ඉරානය, P5 + 1 (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ නිත්‍ය සාමාජිකයන් 5 - චීනය, ප්‍රංශය, රුසියාව, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සමග ජර්මනිය) සහ යුරෝපා සංගමය අතර 2015 ජුලි මස 14 වන දින වියානා හි දී තීන්දු කරන ලද ඉරාන න්‍යෂ්ටික වැඩසටහන පිළිබඳ වූ එකඟතාවය අදහස් වේ ;

''අමාත්‍යවරයා'' යන්නෙන් විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ ;

''අයිතිය දැරීම'' යන්නෙන් සංස්ථාපිත මණ්ඩලයක හෝ ආස්ථිත්‍යයක සියයට විසි පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට සෘජුව හෝ වක්‍රව නෛතික හිමිකමක් තිබීම අදහස් වන අතර ''අයිතිය දරනු ලැබූ'', ''අයිතිය'' සහ ''අයිතිය දරනු ලබන'' යන පදවලට අනුරූපී අර්ථ තිබේ ;

''තැනැත්තා'' යන්නට (2 වන අධිකාරිය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ;

08 - 99

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.